ද මැසිනොද් විදුහල, කඳාන

# De Mazenod College Kandana

## සිංහල I පත්‍රය

13 ශ්‍රේණිය

27.03.2018

Learning Resource Center
R
De Mazenod College

විභාග අංකය .............................. සිංහල I කාලය පැය තුනයි

❖ පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. i. පහත දැක්වෙන උද්ධෘත කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අ. මුගලන් මහ තෙරුන් වහන්සේ යහපතැයි ගිව්ස බිමින් යන ගමන් කල් යන හෙයින් අහසින් ඒ නියම්ගමට වැඩ මාළිගාවේ සිව්මැඳුරු කවුළුව ගාවා ගැටවටු ගන්වා අහස ඉඳුනිල් මිණිරුවනක් මෙන් වැඩ සිටි සේක. සිටාණෝ ද තෙරුන් වහන්සේ දැක " මමත් වැළිත් මෙතැනට එන්නෙම් පාත වී නම් යමෙක් එතැනට සම්භ වෙති. සම්භ වූ නම් මා පවා පෙතීලා කබලුකැවුමට ආලය කළ කල ඌ තුමු මෙතරම් දෙයකට කැල ම ආලය කෙරෙති යි උන් උන් කෙරෙහි ම සැකයෙන් මෙතැනට අයිමි. සීනෙන් සැඟවෙන්ට බැරියා සේ මුයින් අවුදින් මෙතැනට සම්භ වූය. ආදි ම කවුළුදොරත් මෙසේ වූ අවුල් තකා වසාලන්ට නුවු හෙයින් මුන් අවුත් සිටිය දි වසාලන්නටත් තරම් නොවෙයි කළමනා කිම් දොහෝයි සිතත් කබලු කන්ට සිතාගත් උපදේශ මුත් පරලොවින් ගැළවෙන උපදෙස් පමණකුත් තමත් නොදත් හෙයින් එසේ වූ තැනට සිතන්නට තිස්සක් සිතාගත නොහී ගින්නට දමා ලූ ලුණු මෙන් තනනමින් 'මහණ, මේ අහස සිටිනා තබා සක්මන් කෙළෙහි නමුත් මින් ලබන දෙයක් නැතැ'යි කීය.

i. මුගලන් හිමි අහසින් වැඩියේ කුමන හේතුවක් නිසා ද?

ii. මුගලන් හිමි සිව්මැදුරු කවුළුව අසළ වැඩ සිටියේ කෙසේ ද?

iii. "ගින්නට දමා ලූ ලුණුමෙන් තතනමින්" යන උපමාවෙන් හෙළිවන භාවය කුමක් ද?

iv. " සිතන්ට නිස්සක් සිතාගත නොහී " යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 4 යි)

ආ. එව්ගස දියකෙළ ඇවිදිනා එක් ඇතෙක් සත් බුමු මහපියුමක් මා බල බලා සිටිය දි තමන්ගේ ප්‍රිය භාර්යාවට දුන්නේ ය. මට නුදුන්නේ යයි නැවතත් බෝධිසත්ත්වයන් කෙරෙහි වෛර වූවා ය. නැවත එක් දවසක් මිහිරි ඵලාපල හා නෙඹුදැලි, පොකුරු මී හා එක්ව යොදා පන්සියයක් පසේබුදුවරයන් වහන්සේට දන් දී ප්‍රාර්ථනා කරන්නී මේ ආත්මභාවයෙන් චුත ව ගොස් මධුරාජකුලයෙහි ඉපිද සුභද්‍රා රාජකන්‍යාව වැඩිවිය පැමිණ බරණැස් රජහට අග මෙහෙසුන් ව ප්‍රියවචන වඩන්නෙමි. ඒ රජුහු ම වසඟ කොට කීවා කරන පරිද්දෙන් මා නතුකරවා ගෙන ඕහට කියා එක් වැදි පුත්‍රයෙකු මෙහි වමත් පෙදෙසකට යවා මේ ඇත්රජහු විෂ පෙවූ සැරයකින් විද ජීවිත විනාශයට පමුණුවා සවනක් රැස් විහිදුනා වූ දළ සඟළ ගෙන්වා ගන්ට සමර්ථ වෙම්වයි කියා ප්‍රාර්ථනා කළා ය.

i. මෙහි සඳහන් තැනැත්තිය බෝසතුන් සමඟ වෛර වීමට හේතුව කුමක් ද?

ii. පසේ බුදුවරුන්ට දුන් දානයෙහි අඩංගු වූයේ මොනවා ද?

iii. ඇය ඉටුකර ගැනීමට උත්සාහ කරන අරමුණ කුමක් ද?

iv. "කීවා කරන පරිද්දෙන් මා නතුකරවා ගෙන" යන්නෙහි අරුත් පැහැදිලි කරන්න. (ලකුණු 4 යි)

ඉ. මෙසේ රජ්ජුරුවන් උන් කල්හි අශෝකමාලා දේවී තමන් සිය අතින් පිළියෙල කරන ලද නොයෙක් රසයෙන් උද්දාම වූ රසමසවුලෙන් යුක්ත සුවඳ හැල් සාලේ බත් රජ්ජුරුවන් පෙරට තබා තුමූම බත් අනුභව කරවූහ. රසයෙන් උද්දාම වූ නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත බත් අවුලූ ආදිය මෙහෙ නිවමා සතුටු වූ රජ්ජුරුවෝ " මෙබඳු මේ කුමාරිකාව පරීක්‍ෂා නොකොට ම පුතණුවන් කෙරෙන් මඳකින් පහ කළෙම් වෙමි'යි සිතමින් දෙමහල්ලන් ළඟට කැඳවා අවවාද කොට මූ ඉතා ආශ්චර්යවත් කුමාරිකා කෙනෙකැ'යි කියමින් එම විට රුවන් රුසක් පිට සිටුවා අභිෂේක මඟුල් කොට ශාලිරාජ කුමාරයන්ට පාවා දී තමන්ගේ මාලිගාවට ම ගියහ. අශෝකමාලා දේවී රාජ්පුරුවන් මෙහෙ නිම වූ පරිද්දෙන් ම රජ ඇමතියන් හා මහ සෙනග ද බත් කැවූහ. එකල ඔහු කුමාරිකාවෙන්ගේ ගුණ කියා ස්තුති කරන්නාහු මේ ලෝකයේ සියලු සත්ත්වයෝ ම නොයෙක් අභිවෘද්ධි සඳහා ගෝකුණෙහි උපදනා ලද ගොරද නොදමා ඇරගනිති. ගෝකුණ එසේ නොගන්නා හු ම ය. එසේ හෙයින් උපන් ජාතිය කුමක් කෙරේද? ගුණ ම වේද උතුම් වන්නේ යයි කිය කියා වර්ණනා කරෙමින් ගියාහ.

i. අශෝකමාලා රජුට බත් අනුභව කරවූයේ කෙසේ ද?

ii. රජු යටි සිතින් පසුතැවිලි වූයේ කුමන හේතුවක් නිසා ද?

iii. උපන් ජාතිය වැදගත් නොවේ. ගුණය පමණක් වැදගත් වේ. යන අදහස පැහැදිලි කර ඇත්තේ කෙසේද?

iv. "මෙහෙ නිමවා" "රුවන් රුසක්" යන වචනවලට අර්ථ සපයන්න (ලකුණු 4 යි)

ඊ. පසිඳු මොහුගෙ දළ දන් දලදර පබඳ
දිළිඳු සිතෙයි කලිමල දෙවියේ මතුඳ
කිවිඳු වදන් බිම බැබැළුම් කළ නිබඳ
සිනිඳු යසස් ලිය සුනුඹුල් නොමඳ

සකත අයුරු පැරකුම් නිරිඳුගෙ පවර
සමත විපුල් බල සිවුරඟ සෙන් ළතර
දිගත පැමිණෑ කො ද නොපහළ රුපු නුවර
යුගත සයුරු රළ නොපහළ තැන් කවර

i . දිළින්දන්ගේ සිතෙහි ලෝභය සේදී ගියේ කෙසේ ද?

ii. "සිනිඳු යසස් ලිය" යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.

iii. සතුරු නගර පරාජයට පත් වූයේ කුමන හේතුවක් නිසා ද?

iv. "සකත" හා යුගත යන පදවල අරුත් ලියන්න.

(ලකුණු 4 යි)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොට ගෙන තමතමන්ට පිහිට විය යුතු ය."

(ii) "සියලු වැව් පොකුණු හෝ කඳුරැලි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරී සිටිනේ ය."

(iii) "එසේ හෙයින් නැවත ගිහිගෙය විසිය නො හෙමි."

(iv) "ඕක පරෙස්සමෙන් තියාගන්න. හරි වටින දෙයක්."

(v) "යකෙක්, යකෙක්, මේ මූණමල් ගහේ යකෙක් ඉන්නවා."

(vi) "හාමු මං ගිහින් එන්නම්. හාල් තුනපහ ගන්ඩ කඩේ යන්ඩත් තියෙනවා" (ලකුණු 08 යි.)

27.03.2018
සිංහල
13 ශ්‍රේණිය

(අ) පහත සඳහන් කවි පංතිය පිළිබඳ රසාස්වාදයක් ලියන්න

පඩි පෙළින් උඩඟු කළු මහ ගෙදර ආලින්දෙ
ලී කුලුණු යා කරන ලීස්තර වැට මැදින්
නෙත් හෙළමි අදත් මම කුඩා දරුවෙකු ලෙසින්
පාළුවෙන් පුරන් වූ ඈත වෙල් එළිය වෙත

මෝස්තර කැටයමින් ගැබලෙනා ලී පටි ද
අලුත් බීරළු සේ ම දිලෙන සැම දා සුදු ද
වට කලේ ජීවිතය බෝ කොටුවක් ලෙසින්
සැම දේ ම මා දුටුවෙ ලීස්තර වැට මැදින්

පාන ළඟ වැඳ වැටෙන අම්මාගෙ මුව මඩල
පසුපසින් පෙළ ගැසෙන නැගණියන්ගේ පිළිම
සැඳෑ එළියේ ඇඳෙන සංසාර සෙවණැල්ල
බලා සිටියෙමි තනි ව ලීස්තර වැට මැදින්

වසරකට වතාවක් පිළිසකර කර වැට ම
පාට ගෑවේ සුදට සාර්ලිස් බාස් වීත්
මගේ සිත අලුත් වී ලීස්තර වැට සමඟ
අමුතු එළියක් වැටිණ එවිට මිදුලට සිතට

මා අවට ගලා ගිය ජීවිතය දෙස නිතර
සුදු ලීස්තර මැදින් බලා සිටියා මීසක
උස් පිලෙන් බිමට බැස ඒ දිවිය වෙත එළැඹ
වෙළෙන්නට ගැටෙන්නට හරස් විය මේ වැට ම

පාළුවෙන් පුරන් වූ ඈත වෙල් එළිය මෙන්
මගේ සිත පුරන් වී ඇත මෙදින ශෝකයෙන්
කොළ හැළුණු මිදුල මත නගා සර සර හඬක්
පාන් පැල ළඟට යන අම්මාගෙ සේයාව
සැඳෑ එළියේ ඇඳෙන සංසාර සෙවණැල්ල
බලා සිටිනෙමි අදත් ලීස්තර වැට මැදින්

Learning Resource Center
R
De Mazenod College
Kandana

02. ගැමි සමාජය ඇසුරෙන් ලද ජීවන අත්දැකීම් තම කතා රචනය කිරීම සඳහා යොදා ගැනීම ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ විශේෂ ලක්ෂණයකි. සුදුසු නිදසුන් ඇසුරෙන් විමසන්න.

නැතහොත්

ජාතක කතා කරුවාගේ මූලික අරමුණ වන්නේ පොදු මිනිස් අත්දැකීම් විවරණය කිරීමයි නිදසුන් දෙමින් විමසන්න.

03. සද්ධර්මලංකාරයේ භාෂා ශෛලියේ විශේෂත්වයක් දක්නට ලැබෙයි. උචිත නිදසුන් දෙමින් විස්තර කරන්න.

04) ගිරා සංදේශ කතුවරයා ස්වභාව සෞන්දර්ය සියුම්ව නිරීක්ෂණය කිරීමට සමත් වූ ආකාරය වර්ණනා දෙකක් ආශ්‍රයෙන් විමසන්න.

05) තමන් නිරූපණය කරන චරිතවල ස්වභාවය පාඨක හදවත්හි සනිටුහන් වන ආකාරයෙන් භාෂාව නිර්මාණයට නව කතා කරුවා සමතෙකි. මෙම අදහස මළගිය ඇත්තෝ නව කථාව ආශ්‍රයෙන් නිදසුන් දෙමින් විස්තර කරන්න.

06) නූතන කෙටිකතා කරුවා සමකාලීණ සමාජය විනිවිද දැකීමට සමතෙකි නිර්දේශිත කතා තුනක් ආශ්‍රයෙන් ඔබගේ අදහස් දක්වන්න.

07) නූතන කවියා අවස්ථාවට උචිත ලෙස කාව්‍ය අලංකාර නිර්මාණයට සමතෙකි. නිදසුන් පද්‍ය තුනක් මගින් විස්තර කරන්න.

08) රත්නාවලි නාට්‍යයේඋදයන රජුගේ චරිතය පිළිබඳ විග්‍රහයක් කරන්න.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය - ...

# සිංහල II

පැය තුනයි

Learning Resource Center
De Mazenod College
Kandana

27 - 03 - 2018

උපදෙස් :

- ★ I කොටසේ I ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ★ I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- ★ I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 ඝෝෂාක්ෂර පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ත, ඵ, ද, ධ, න
(2) ට, ඨ, ඞ, ඩ, ණ
(3) ක, ඛ, ග, ඝ, ඞ
(4) ය, ර, ල, ව, ස
(5) ප, ඵ, බ, භ, ම, (.............)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) අධ්‍යතන, නිර්දිෂ්ට, ඔළමොළ, ඓශ්වර්යය
(2) ප්‍රශස්ථ, සැලකිල්ල, න්‍යෂ්ඨික, අවශෝෂණ
(3) අධිෂ්ඨාන, උද්ඝෝෂණ, ධ්වනිතාර්ථ, ප්‍රතිච්ඡන්න
(4) ප්‍රාසාංගික, විශ්වාසනීය, සම්ප්‍රදාන, නිලධාරියා
(5) සට්ටනය, නිශ්ඵල, කුම්භස්තල, ගුරුමුෂ්ටි (.............)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) අත්‍යන්ත, අත්‍යර්ථ, අතික්‍රමණ, අත්‍යුත්තම
(2) උත්තේජනය, උත්ප්‍රේරණය, උද්වහනය, උත්ක්ෂේපණය
(3) කාර්තිකේය, කාර්යාලය, කාලච්ඡේද, කුරුබිලිය
(4) ජෛවගෝලය, ජීවනාධාර, ජ්‍යාමිතිය, ජ්වලනය
(5) විද්‍යුල්ලතා, විජානනය, විදූෂක, විධායක (.............)

1.4 පහත සඳහන් වරණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) යංශය හා යකාරය වචනයක යොදන්නේ එකිනෙකට සමාන පරිසරයන්හි දී ය.
(2) යකාරය සමග රකාරාංශය ද යෙදිය හැකි ය.
(3) යංශය යනු යකාරයට යෙදෙන තවත් නමකි.
(4) යංශය සමග පමණක් රේඵය යෙදේ.
(5) යංශයට මුලින් යෙදෙන ව්‍යංජනාක්ෂරය හල් අකුරක් වශයෙන් උච්චාරණය වේ. (.............)

1.5 ඇදය, දීර්ඝ ඉස්පිල්ල, පාපිල්ල, රකාරාංශය සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ඇමුණුම, උද්දීපනය, ගොපළු, ආශ්‍රය
(2) ගැඹුරු, කවීන්ද්‍ර, අප්‍රාණික, තුරඟ
(3) ඇටිකුකුළා, සීතිබෝල, ග්‍රන්ථිස්ථාන, චුම්බනය
(4) පැහැබර, ප්‍රදර්ශනය, දුර්භික්ෂ, ද්විතීය
(5) ලීලෝපේත, කැහැටු, කටුකම්බී, ත්‍රාසජනක (.............)

1.6 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) තෙවලා දහම්, සහස් රැස්, පළමු තෑග්ග, මඳ මරු
(2) අභිෂේක මඟුල, දෙව් ලොව, කල්‍යාණ මිතුරු, උපන් බිම
(3) කර්තෘ වාක්‍යය, මනුෂ්‍ය ඇස, මාග රජ, විශ්‍රාම ශාලාව
(4) මධ්‍යම පිළිවෙත, සරා සඳ, මේස කුල, ක්ෂීර සයුර
(5) ජීවිකා වෘත්තිය, රාත්‍රී කෑම, අමෘත බොජුන්, අෂ්ටාංග සිල් (.............)

[2වන පිටුව බලන්න.

1.7 මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නො දෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) කඨෝර - මෘදු, මොළොක්, ස්නිග්ධ, කෝමල
(2) අල්ප - බොහෝ, ඉමහත්, අපමණ, අනල්ප
(3) පාප - පුණ්‍ය, කුසල්, හොඳ, වාසනාව
(4) සංවර - අසංවර, නොහික්මුණු, අදාන්ත, අමනෝඥ
(5) සුන්දර - අසුන්දර, විරූපී, කැත, අවලස්සන

(............)

1.8 මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නො වන වරණය තෝරන්න.
(1) මලවි - තිනෙත්, මදරද, අනංග, මල්සර
(2) විශාල - නැඹුළු, පෘථුල, තුමුල, මහත්
(3) කම්පාව - කැලඹීම, ක්ෂෝභය, සෙලවීම, චලනය
(4) අපර දිග - බටහිර, පශ්චිම දිශා, අවර දිග, පැළ දිග
(5) අවිනිශ්චිතතාව - සංකාව, ශංසය, අස්ථිරතාව, අනුමානය

(............)

1.9 තත්සම වචනයක් ඇතුළත් නො වන පද පේළිය තෝරන්න.
(1) මරණ, කල්පාන්ත, දර්ශක, ක්ෂේම භූමි
(2) මාර්ගස්ථ, ප්‍රශස්ත, භයානක, උපස්ථායක
(3) අභ්‍යවකාශය, බ්‍රාහ්මණ, පරීක්ෂණ, ඖෂධ
(4) ආභරණ, මනෝවිද්‍යාව, රක්ෂණ සංස්ථාව, භීෂණ
(5) සාමණේර, තාරුණ්‍යය, ගාත්‍රාක්ෂර, ඇරයුම්

(............)

1.10 අව්‍යය, විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති පේළිය තෝරන්න.
(1) යථාතත්වය, පුරබොජුන්, කෙටිකතා, බටහිර
(2) පින්පව්, ගත්කරු, රත්හඳුන්, මලවි
(3) ප්‍රසිද්ධ, ගම්වැසි, මුවකඹර, රහල්තෙර
(4) කිරිබත්, අනුමෝදනා, තෙරුවන, සහෝදර
(5) අනුග්‍රැති, මිණිමුතු, මහබැංකුව, වගවලස්

(............)

1.11 කෘදන්ත පදයක් අන්තර්ගත නො වන වරණය තෝරන්න.
(1) වස්නා, රක්නා, බස්නා, ගන්නා
(2) වන්දනීය, මානනීය, පූජනීය, දර්ශනීය
(3) වැපිරිලි, ඇඟලිලි, දෙඩවිලි, ලියවිලි
(4) ඉරුණු, මැරුණු, දරුණු, පිරුණු
(5) දිවූ, හැඬූ, දැරූ, ගැලූ

(............)

1.12 පහත සඳහන් වැකිවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
* ඔහු ගීයක් ගයන්නට විය
* බල සේනානායක සපු කුමරු එන
* මා එසේ කීවා ම ඇය ප්‍රීති වූවා ය
* එතැනින් ගොසින් සැණෙකින් රජ වීමන් වදු
(1) අපරක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා
(2) අපරක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා
(3) විධික්‍රියා, අපරක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(4) අපරක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(5) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, අපරක්‍රියා

(............)

1.13 අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) හිමියෝ, වෙදුන්, සුදපාන්, ඇතැමුන්
(2) ඔවුන්, පියවරු, බුදුහු, ඇතකු
(3) දෙදෙනකු, ළමයෙක්, දැරියක, අප
(4) තොප, යුෂ්මතුන්, විද්වතුන්, ගණකාධිකාරිවරු
(5) ගෙවිලියක්, නීතිඥවරියක, ගම්මු, සහකාරියක්

(............)

[3වන පිටුව බලන්න.

13 ශ්‍රේණිය ·

 27 · 03 · 2018 සිංහල II

1.14 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

(1) නිර්මාංශ, ප්‍රබුද්ධ, පරිශුද්ධ, සම්පූර්ණ

(2) උපමාන, දුෂ්කර, සුලක්ෂිත, අපද්‍රව්‍ය

(3) අගුණ, නින්දිත, සපුරන, අනාචාර

(4) නිමල, ඉමහත්, විමල, ප්‍රතිග්‍රහණ

(5) දුදන, අනුබල, අකල, විකාර (.............)

Learning Resource Centre
R
De Mazenod College
Kandana

1.15 ළඟ **තුරුමල් ගිලිහුණු** රොන'**වුලේ** යා
මග බැස **යව** පළ හෙළ වැලි තෙලේ යා

යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පද අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සමාස, කෘදන්ත, සන්ධි, විධික්‍රියා

(2) සන්ධි, කෘදන්ත, සමාස, විධික්‍රියා

(3) කෘදන්ත, සමාස, සන්ධි, විධික්‍රියා

(4) සන්ධි, සමාස, කෘදන්ත, විධික්‍රියා

(5) සමාස, සන්ධි, කෘදන්ත, විධික්‍රියා (.............)

1.16 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක් ද?

(1) තැවූ, වැඩූ, නැවූ, මැවූ

(2) විනා, මොකද, වස්, සඳහා

(3) සිඟිති, නළලත, ජනතා, පත්‍රිකා

(4) දැඟලිලි, රනෝවිලි, ගෙරවිලි, තේරවිලි

(5) බඩුමිල, ළමාපොත්, බුදුපුද, පින්හාල් (.............)

1.17 සමාස පදයක් ඇතුළත් නො වන වරණය තෝරන්න.

(1) මව්පිය, අනුවිෂය, දුර්වල, සුබෝධ

(2) කම්කරු, ගත්කරු, දෙව්දත්, වේපස්

(3) සොරබිය, සතුරුබිය, ගිනිබිය, මරබිය

(4) නවදොර, තුන්දොර, අටසිල්, දසපනත

(5) බඹසුරනර, දසබල, සරනැස, නරරකුසු (.............)

1.18 එක ම වර්ගයකට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) අත්‍යුදාර, පරමේශ්වර, හබරල, නිරවුල්

(2) සුළංපහර, වළත්කැබලි, ගංමෝය, දැත

(3) පුදසුන, යථාවබෝධය, පිළිතුරු, අරුණලු

(4) යන්ත්‍රෝපකරණ, වීරෝදාර, පුණ්‍යෝත්සවය, දේශානුරාගය

(5) අතිනත, නළඟන, රළැති, කර්මානුරූප (.............)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(1) ඔහු ද මම ද රැස්වීමට ගියෙමි.

(2) නේවාසික දොස්තර කෙනෙක් වාට්ටුවේ සිටිති.

(3) මම ගමට යද්දී ළමයා මෙසේ කීවේ ය.

(4) ඕ තොමෝ හෙළ දැරියක් නො වූවා ය.

(5) තොපි ඔවුන් ඇසුරු කළ යුතු නො වේ. (.............)

1.20 වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.

(1) විශ්ව ගම්මාන සංකල්පයමත මුළු ලෝකයම එකට බැඳී ඇත.

(2) ප්‍රෞඪත්වය මෙන් ම අදීනත්වය හා සමගි දාමය ද අප හදවත් තුළ රැඳී තිබිය යුතු ය.

(3) කවියා සැබෑ ලෝකය හා සම්බන්ධවූ තරමට ඔහු ගේ නිර්මාණ පාඨකයාගේ පිළිගැනීමට ලක්වෙයි.

(4) වසං ගත රෝග වල භයානකකම අප නිතර ම ප්‍රත්‍යවේක්ෂණය කළයුතු ය.

(5) ක්‍රීඩාවේ උතුම් පරමාර්ථය නම් ජයග්‍රහණයම සඳහා තරගවැදීම පමණක් නොව ඊට සහභාගි වීම ය.

(.............)

(ලකුණු 20 යි)

[4වන පිටුව බලන්න.

## II කොටස

* මෙම කොටසේ 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාව ජලයෙන් පෝෂිත රටකි. ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම හේතුවෙන් නිරිත දිග සහ ඊසාන දිග මෝසම් සුළඟ අපට ප්‍රධාන වශයෙන් වැසි ගෙන දෙන අතර කුඩා දිවයිනක් වීම නිසා සංවහන වැසි ද සුලභ ය. රට මැද පිහිටි මධ්‍යම කඳුකරය නිසා පතිත වර්ෂාව රට පුරා විහිදී ගංගා 103ක් ඔස්සේ මුහුදට ගලා යයි. බටහිර, නිරිත සහ දකුණු දිග ප්‍රදේශය ප්‍රබල නිරිත දිග මෝසම් සුළං මුහුණතේ පිහිටීමෙන් ජලය සුලභ ව ලැබේ. එහෙත් ඊසාන දිග මෝසම් සුළඟ විශාල ගොඩබිම් කලාපයක් හරහා හමා එන බැවින් ජලවාෂ්ප අඩු නිසා එමගින් ජනිත වර්ෂාව අඩු ය. එබැවින් ඊසාන දිග මෝසම් මුහුණතේ පවතින කලාපය රටේ වියළි කලාපය බවට පත් ව ඇත. එනමුදු අනුරපුර පොළොන්නරු රාජධානි පැවැති කාලයේ දී කෘෂිකර්මාන්තය අග්‍රස්ථානයක වැජඹුණු අතර අපරට පෙරදිග ධාන්‍යාගාරය නමින් ද හැඳින්විය. එදවස අහසින් පතිත ජලය ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩක් නො වීම එයට හේතුව විය. වැව් බැඳි රජරට සහ රුහුණේ පැවැති වාපි සංස්කෘතිය ශ්‍රී ලංකාවට ආවේණික ජල කළමනාකරණයයි. එය ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් කරා ශ්‍රී ලංකාව රැගෙන ගියේ ය. තෙත් කලාපයට ලැබුණු අධික වර්ෂාව තම ජීවනෝපාය සඳහා නොගැළපුණු බැවින් වියළි කලාපයේ වසන්නට අපේ ආදිතමයෝ උනන්දු වූහ. එහෙත් ඒ සඳහා ද ප්‍රමාණවත් වර්ෂාවක් ලැබුණේ නැත. එබැවින් ලද වර්ෂාවේ ජලය එක්රැස් කර ප්‍රයෝජනයට ගැනීමට ආදී වැසියා උත්සුක වූයේ ය. වාපි සංස්කෘතිය එමගින් අප ලත් දායාදයකි.

(i) ශ්‍රී ලංකාවට වැසි සුලබ වීමට බලපාන හේතු ලෙස ඉදිරිපත් කළ හැකි කරුණු මොනවා ද?
(ii) ආදිතමයන් තෙත් කලාපය බැහැර කොට වියළි කලාපයේ වාසය කරන්නට රුචියක් දැක්වූයේ ඇයි?
(iii) වාපි සංස්කෘතිය අප රටට දායාද වූයේ කෙසේ ද?
(iv) ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් උදාකර ගත්තේ කෙසේ ද?
(v) ඊසාන දිග මෝසම් මුහුණතේ පවතින ප්‍රදේශය රටේ වියළි කලාපය බවට පත් වූයේ ඇයි?

(ලකුණු 10 යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා එහි වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

පර්යේෂකයන්ගේ නිගමනවලට හා විද්‍යමාන භාෂා වාර්තා සාක්ෂිවලට අනුව සිංහල භාෂාව පැරණි ඉන්දු ආර්ය භාෂා සම්ප්‍රදායෙන් තත්භව වූවක් ලෙස පිළිගැනේ. සිංහලය හා ඉන්දු ආර්ය භාෂා අතර පවත්නා ශබ්ද නීතිගත සාම්‍යතාව මෙයට ප්‍රධාන සාධකය ලෙස ඔවුහු සඳහන් කරති. එහෙත් සිංහල භාෂාව විකාශනයෙහි එක් එක් අවස්ථාවල දී විවිධ භාෂා සම්ප්‍රදායවල ආභාසය ලැබී තිබෙන බව දැක ගත හැකි ය. එසේ බලපෑ ප්‍රධාන භාෂාවක් ලෙස බොහෝ දෙනාගේ අවධානයට ලක් ව ඇත්තේ දෙමළ භාෂාව යි. දෙමළ භාෂාව අංශ කිහිපයක් ඔස්සේ සිංහලයට බලපා තිබීම මෙයට හේතුව යි. භූ විස්තෘතිය වශයෙන් සිංහල භාෂාවට වඩාත් ආසන්න ව දක්නට ලැබෙන්නේ ද්‍රවිඩ භාෂා ගණයට අයත් භාෂා ය. එසේ ම වර්තමානයේ පවතින ව්‍යවහාරවලට අමතර ව ක්‍රි. පූ. 3 වන සියවසේ සිට අද තෙක් ම අඛණ්ඩ ව පැවත එන සිංහල ලේඛන සම්ප්‍රදායට දෙමළ භාෂාවේ ආභාසය ලැබ තිබීම ද එක් සාධකයකි. මේ ඔස්සේ ද්‍රවිඩ සෘණ වචන රාශියක් සිංහලයට එකතු වී ඇත. මීට අමතර ව බොහෝ දෙනෙකු පෙන්වා දෙන ආකාරයට සිංහලයේ වාක්කෝෂය මතු නො ව වියරණය ද සැකසී ඇත්තේ දෙමළ ව්‍යාකරණය පදනම් කොටගෙන ය. ව්‍යාකරණ නීති රීති මගින් ද විවිධ පද යෙදුම් එකතු වෙමින් සිංහලයේ වාක්කෝෂය පෝෂණය වීමට දෙමළ භාෂාව බෙහෙවින් ම බලපා ඇති බව උගත් භාෂාඥයෝ පෙන්වා දෙති. ක්‍රි.පූ. යුගවල පටන් ම දෙමළ භාෂාව සිංහලය කෙරෙහි බලපාමින් පැවති බව පෙන්වා දෙන වාග්වේදීන් සඳහන් කරන්නේ එය දෙයාකාරයකින් සිදු වී ඇති බව යි. එනම්, ද්විභාෂක ලේඛකයන් මගින් හා පොදු ජනතාව හා දෙමළ භාෂකයන් අතර වූ සම්පර්කය මගින් ය.

(ලකුණු 15 යි)

[5වන පිටුව බලන්න.

27.03.2018
සිංහල
13 ශ්‍රේණිය



3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

1. දේශපාලන ස්ථාවරත්වය හා රටේ සංවර්ධනය.
2. වර්තමාන සිනමාව සහ ජනතා සහභිත්වය
3. මත් ද්‍රව්‍ය උවදුර සහ තරුණ ජීවිත
4. ලංකාවේ වර්ධනය වෙමින් පවතින අපරාධ රැල්ල
5. පුරා වස්තු සුරැකීමේ ජාතික වගකීම
6. ක්‍රීඩාව සහ සංවර්ධනය

Resource Center R De Mazenod College Kandana

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.
   (i) හෙතෙමේ ප්‍රේක්ෂකයින් පිනවමින් කරණමක් ගැසුවා ය.
   (ii) ත්‍රස්තවාදීහු අද පහර දෙන්නාහ'යි බලධාරිහු විශ්වාසය පළ කළහ.
   (iii) ව්‍යක්ත කථිකයෙක් ගොවිජන රැස්වීමේ කතා කරනු ඇත.
   (iv) මේ නිවෙස්වල වෙසෙසන්නෝ කවුරු ද?
   (v) ඔවුහු ක්‍රීඩකයන් මෙන් ම නළුවන් ද වූහ. (ලකුණු 05 යි)

(ආ) පහත සඳහන් වාක්‍යය කර්මකාරකයට හරවන්න.
   (i) රජය නව ඖෂධ ප්‍රතිපත්තියක් සම්මත කර ගනියි.
   (ii) රංග භූමියට පිවිසි ශිල්පීහු ස්වකීය රංගනයෙන් ප්‍රේක්ෂකයන් කුල්මත් කරති.
   (iii) මෙවර රාජ්‍ය සම්මාන සාහිත්‍ය උත්සවයේ දී කෙටිකතා පිළිබඳ ප්‍රථම ත්‍යාගය මම ලබා ගතිමි.
   (iv) කාව්‍යය, අලංකාරවලින් පමණක් සැරසිය යුතු ය යන මතය ඇතැම් විචාරකයෝ ප්‍රතික්ෂේප කළහ.
   (v) ගුවන් යානා පැදවීම සඳහා දීර්ඝකාලීන පරිචයක් අවශ්‍ය බව විද්‍යාඥයෝ ප්‍රකාශ කරති. (ලකුණු 05 යි)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
   (i) අවිදග්ධ ප්‍රේක්ෂකයන් සිනා සිඳියේ ඔහු දක්ෂ ටෙලි නාට්‍ය (නිෂ්පාදකයෙකු/නිෂ්පාදකයෙක්) බවයි.
   (ii) දේශකයන් ඉදිරිපත් කරන විවිධ කරුණු ගැන (අසන්නෝ/අසන්නන්) විමර්ශනශීලි වෙත්.
   (iii) උත්තුංග කඳුගිබරවලින් කඩා හැලෙන රජතධාරා බඳු දිය ඇලි රාශියක් ශ්‍රී ලංකාවේ (විද්‍යමාන වේ./විද්‍යමාන වෙති.)
   (iv) (උගත්තු/උගතුන්) නමින් පෙනී සිටින පණ්ඩිතමානීන්ගේ උපදේශ නිසා මහජනතාව මුළාවට පැමිණේ.
   (v) වනයේ (හස්තීන්/හස්තිහු) කුංචනාද කරද්දී වඳුරු රංචුව තුරු මුදුන් මතට නැග ගත්හ. (ලකුණු 05 යි)

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර දක්වන්න.
   (i) අවසන් මොහොතේ දී පවා උන්වහන්සේ අත්තුක්කංසනයෙන් තොරව ඇසූ පැනයට පිළිතුරු දුන් සේක.
   (ii) ජාතික ආරක්ෂාව පිළිබඳ ව කතා කිරීමේ දී මාධ්‍යවේදීන් ස්වයංවාරණයකින් කටයුතු කිරීම කාලෝචිත පියවරකි.
   (iii) අනගාරික ධර්මපාලතුමා නිශ්ශරණාධ්‍යාශයෙන් සිය වගකීම් හා යුතුකම් ඉටු කළේ ය. (ලකුණු 03 යි)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු තනිපද ලියන්න.
   (i) කිසිවෙකුට උපමා කළ නොහැකි
   (ii) පහතින් ලියන ලද ලිපි
   (iii) කිසියම් දෙයක ස්වභාවය ගැන තීරණය කළ නොහැකි (ලකුණු 03 යි)

(ඉ) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.
   (i) පාඩම ඉගැන්වූ පසු පසුබට දරුවන් .................................... කිරීම අවශ්‍යයෙන් ම කළ යුත්තකි.
   (ii) විමධ්‍යගත අරමුදලින් නියමිත .................................... ලබා දෙන බව රජය ප්‍රකාශ කළේ ය.
   (iii) අනිවාර්ය විෂයන්ට අමතරව ශිෂ්‍යයා .................................... විෂයන් ද තෝරා ගත යුතු ය.

[6වන පිටුව බලන්න.

(iv) අසාධාරණයට එරෙහිව ...................................... වැඩ වර්ජන ක්‍රියාමාර්ගයක් ගන්නා බව විරුද්ධ පාක්ෂිකයෝ පැවසූහ.
(v) උන්වහන්සේගේ චරිතයේ විශේෂ ලක්ෂණයක් වූයේ ............................ මතවාද ඉවසීමයි.
(vi) නිවුන් දරුවන් තුළ පවා ................................ ස්වභාවයක් පෙනුණත් වෙනස් ගති ලක්ෂණ ද විද්‍යමාන වන බව මනෝවිද්‍යාඥයෝ ප්‍රකාශ කරති.
(ප්‍රතිපක්ෂ, ප්‍රතිපාදන, අනන්‍ය, ප්‍රතිපෝෂණය, වෛකල්පික, දීපව්‍යාප්ත) (ලකුණු 03 යි)

(ඊ) තද කළු අකුරින් දක්වා ඇති බහුඅර්ථ පද යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් තනන්න.
(i) ඉසි කෝ මදමානයෙන් පිරුණු සිත් සතන් තුළ ගුණ දහම් වගාව දුෂ්කර වේ.
(ii) කවර අභියෝගයක් හෝ ජය ගැනීම උදෙසා මිනිසුන් තුළ තිර අධිෂ්ඨානයක් තිබිය යුතු ය.
(iii) වන පෙත සිසාරා හමා ගිය මද සුළඟින් සංචාරකයින්ගේ සිත් සතන් ප්‍රබෝධවත් විය.
(iv) රදනියදහම් නො ඉක්මවා රටේ සුභ සිද්ධිය සලසන නරපතියෝ මහජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වෙති.
(v) තුරු මුදුන්වල හැසිරෙන විහඟුන්ගේ ගී රාවයෙන් අවට පරිසරය නිනාදවත් වේ.

**6. පහත දැක්වෙන වාක්‍යවල තදකළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනුඅංගය දක්වන්න.**
(i) තනතුරු පිටුපස **ලුහුබඳින** මිනිස්සු ඇතැම් විට **පාපතර** ක්‍රියාවල **ද** නිරත වෙති. (බඳින - කෘදන්ත, පාපතර - තද්ධිත, ද - නිපාත)
(ii) **බමුණාණෝ සූර්යෝදයට** පෙර **ගංගානදියෙහි** ජලස්නානය කළහ. (බමුණාණෝ - තද්ධිත, සූර්යෝදය - සන්ධි, ගංගානදිය - සමාස)
(iii) **සුනිල්** දියදහර මත සුපිපි **සුදුනෙළුම** පරිසරය **ප්‍රභාවත්** කළේ ය. (සුනිල් - උපසර්ග, සුදුනෙළුම - සමාස, ප්‍රභාවත් - තද්ධිත)
(iv) දරුවා **ගසින්** ගෙඩියක් කඩා, **පිහියෙන්** එය **කපමින්** මුවගට සිනා නැඟී ය. (ගසින් - විභක්ති, පිහියෙන් - විභක්ති, කපමින් - ක්‍රියා)
(v) **දෙසබසරුස** නඟනු වස් මහමෙහෙයක් **කළ කුමරතුගුවෝ** හෙළහවුල ඇරඹූහ. (දෙසබසරුස - සමාස, කළ - කෘදන්ත, කුමරතුගුවෝ - විභක්ති) (ලකුණු 15 යි.)

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.
i කෙනෙකුගේ වැඩවලින් අනෙකකු ප්‍රයෝජන ගැනීම
ii ලාභය තකා යමක් අමතක කිරීම
iii ක්‍රියාව නොමැතිව කථාවට පමණක් සීමාවීම
iv නුසුදුසු ආකාරයේ පිළියම් යෙදීම
v වැඩි ආරක්ෂාවට තැබූ දෙය විනාශ වීම
vi නියම තත්ත්වය පෙනෙන්නේ ක්‍රියාවෙනි (ලකුණු 03 යි)

(ආ) පහත දී ඇති රූඩීවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.
i අං හරස් කිරීම
ii කිඹුල් කඳුළු හෙළීම
iii දඩමීමා කර ගැනීම
iv හමස් පෙට්ටියේ දැමීම
v පැදුරටත් නොකියා යාම
vi අන්තිම ඉත්තත් ඇදීම (ලකුණු 03 යි)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පද සෑදී ඇති රටාව කුමක් දැ'යි දක්වන්න.
i නින්දා අපහාස
ii මළ ඉලව්
iii පින් පව්
iv කෙළි සෙල්ලම්
v හුරු පුරුදු
vi අනං මනං (ලකුණු 03 යි)

[7වන පිටුව බලන්න.

27.03.2018
සිංහල
13 ශ්‍රේණිය



(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

i පනම් වෙනවා
ii කුන්දානම
iii මුංමාරි
iv වතු මොයියා
v ගසගරත්තුව
vi ගොඩහැරේ

(ලකුණු 03 යි)

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

i බම්මනයා
ii නාම්බුව
iii ඉස්නන්
iv මහමඩිය
v වාවරය
vi ඇලපත් කිරි

(ලකුණු 03 යි)

Learning Resource Center
R
De Mazenod College
Kandana

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කල්පනාකාරිසාමාන්‍යමිනිසුන්තුළහටගන්නාමේහැඟීම්වලටහාත්පසින්වෙනස්වූස්වභාවයක්නවීනවිද්‍යාවෙන්දැක්වෙන්නේයපැන්සිලීන්දගෙන්දගම්මිගුඖෂධයන්දරෝගසුවකිරීමේඅංගයෙහිවිප්ලවයක්ඇතිකරතිබේකෝටිසංඛ්‍යාතමනුෂ්‍යයන්විනාශකරමින්පැවතුණබිහිසුණුරෝගනවීනවිද්‍යාත්මකඖෂධවලින්දැන්පරාජයකෙරෙන්නේයවේගවත්ගගනයාත්‍රාවන්ගෙන්දූරකතරනැතිකෙරෙන්නේයවිදුලිබලයෙන්විස්මයජනකසැපපහසුකම්මනුෂ්‍යයන්ටඅත්කරදෙන්නේයමිනිසුන්ටඋවමනාසෑමදෙයක්මක්ෂණයකින්නිෂ්පාදනයකිරීමටබලයඇතිකර්මාන්තාගාරඇතිවන්නේයඋණසන්නිපාතයමසූරිකාවකොළරාවආදීබිහිසුණුවසංගතරෝගශිෂ්ටසමාජයෙන්අතුරුදහන්වන්නේයශ්‍රීසමෘද්ධියක්සහිතඅනාගතයකටමනුෂ්‍යවර්ගයාළංවෙමින්සිටිනබවබොහෝදෙනවිශ්වාසකරති.එහෙත්මේසමෘද්ධිමත්අනාගතයේසැපසම්පත්භුක්තිවිඳීමටමනුෂ්‍යවර්ගයාඉතිරිවෙතියිකාටනම්කිවහැකිදපරමාණුබෝම්බයත්ඊටත්වඩාවිනාශදායකආයුධත්ජ්ජබලසම්පන්නරටවලආණ්ඩුවලමෙහෙයවීමෙන්මනිර්මාණයවෙමින්පවතින්නේය

(i) ඉහත ඡේදය ශාස්ත්‍රීය යැ'යි බොහෝ සෙයින් ම පිළිගත් ක්‍රමය අනුව පද බෙදා අවශ්‍ය විරාම ලකුණු යොදා නැවත ලියන්න.
(ii) රකාරාංශය සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා දක්වන්න
(iii) 'මසූරිකාව' යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න.
(iv) ඡේදයේ සඳහන් ගැට ඇලපිල්ල හා ගයනුකිත්ත අන්තර්ගත වචන දෙකක් ලියා දක්වන්න.
(v) මේ ඡේදයේ අන්තර්ගත නො වන අනුස්වාරය හා යංශය ඇතුළත් වචන දෙකක් ලියන්න.

(ලකුණු 15 යි)

* * *